

# පාර්ලිමේන්තු විත්ති

පුවත් හසුන

3 වන කාණ්ඩය

සැප්තැම්බර් 2020


01 පාර්ලිමේන්තු රැස්වීම් කාල වේලාවේ වෙනසක්

02 රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ධූරයට මහාචාර්ය තිස්ස විතාරණ

පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ධූරයට මහාචාර්ය චරිත හේරත්

03 පාර්ලිමේන්තුවේ ගෘහ්‍ය කාරක සභාවට සහ ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට සාමාජිකයන් පත් කෙරේ

04 ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තු සම්ප්‍රදායන්

07 ඉදිරිගාමී ගමනක නිරත පාර්ලිමේන්තු පුස්තකාලය

10 මැතිසබය දිනූ කතුන්

12 පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තාව ගැන හැඳින්වීමක් හා හැන්සාඩ් වාර්තා



සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

# පාර්ලිමේන්තු රැස්වීම් කාල වේලාවේ වෙනසක්



සැප්තැම්බර් මාසයේ සිට පාර්ලිමේන්තු රැස්වීම් කාලවේලාවේ වෙනසක් සිදු කිරීමට ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේදී තීරණය විය.

ඒ අනුව සැප්තැම්බර් 22 වැනිදා සිට පාර්ලිමේන්තු රැස්වීම් පෙරවරු 10.00 ට ආරම්භ කර පස්වරු 5.30ට අවසන් වේ. පස්වරු 4.30 සිට පස්වරු 5.30 දක්වා පැවැත්වෙනුයේ සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳ විවාදයයි.

මෙම රැස්වීමට සභානායක අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන, ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක අමාත්‍ය ජොන්ස්ටන් ප්‍රනාන්දු, විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල යන මහත්වරු සහ අමාත්‍යවරුන් වන නිමල් සිරිපාල ද සිල්වා, ඩග්ලස් දේවානන්ද, මහින්ද අමරවීර, ප්‍රසන්න රණතුංග, අලි සබ්රි යන මහත්වරු ද, මන්ත්‍රීවරුන් වන

> "සැප්තැම්බර් 22 වැනිදා සිට පාර්ලිමේන්තු රැස්වීම් පෙරවරු 10.00 ට ආරම්භ කර පස්වරු 5.30ට අවසන් වේ. පස්වරු 4.30 සිට පස්වරු 5.30 දක්වා පැවැත්වෙනුයේ සභාව කල් තැබීමේ යෝජනාව පිළිබඳ විවාදයයි."

රවුෆ් හකීම්, ගයන්ත කරුණාතිලක, ඩිලාන් පෙරේරා, රිෂාඩ් බදියුදීන් සහ එම්.ඒ. සුමන්තිරන් යන මහත්වරු ද සහභාගී වූහ.

# රාජ්‍ය ගිණුම් පිළිබඳ කාරක සභාවේ සභාපති ධූරයට මහාචාර්ය තිස්ස විතාරණ



නවවැනි පාර්ලිමේන්තුවේ රාජ්‍ය ගිණුම් කාරක සභාව පසුගිය සැප්තැම්බර් මස 23 වන දින රැස්වූ අවස්ථාවෙහි එහි සභාපතිත්වය සඳහා මහාචාර්ය තිස්ස විතාරණ පත් කෙරිණි. සභාපති ධූරය සඳහා එතුමන්ගේ නම යෝජනා කරන ලද්දේ රාජ්‍ය ගිණුම් කාරක සභාවේ හිටපු සභාපති ලෙස කටයුතු කළ අමාත්‍ය ගරු ලසන්ත අලගියවන්න මහතා විසින් වීම විශේෂත්වයකි. එතුමන්ගේ නම ස්ථිර කරන ලද්දේ අමාත්‍ය ගරු උදය ගම්මන්පිල මහතා විසිනි.

මහාචාර්ය තිස්ස විතාරණ මහතා මහනුවර ත්‍රිත්ව විද්‍යාලයේ සහ කොළඹ ආනන්ද විද්‍යාලයේ ආදි සිසුවෙකි. 1959 වසරේදී ලංකා විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයෙන් සිය වෛද්‍ය උපාධිය ලබාගත් ඔහු 1971 දී ප්‍රතිශක්ති විද්‍යාව පිළිබඳව පශ්චාද් උපාධියක් ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් හිමිකරගත්තේය. ආචාර්ය විතාරණ 1972 දී කොළඹ, වෛද්‍ය පර්යේෂණ ආයතනයට සම්බන්ධ වූ අතර 1983 සිට 1994 දී විශ්‍රාම යන තෙක් එහි අධ්‍යක්ෂ ධූරය දැරීය. විතාරණ මහතා වෛරස විද්‍යාව පිළිබඳ උපදේශකවරයකු මෙන්ම ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙහි ක්ෂුද්‍රජීව විද්‍යාව පිළිබඳ මහාචාර්යවරයෙකු ලෙසද සේවය කර ඇත. පසුකාලීනව විතාරණ මහතා විද්‍යා හා තාක්ෂණික කටයුතු අමාත්‍යවරයාගේ උපදේශකවරයකු ලෙසද කටයුතු කර ඇත. ඔහු කළ සේවය උදෙසා 2017 වසරේදී විද්‍යාජෝති සම්මානය ද පිරිනැමිණි.

වෛද්‍යවරයකු ලෙස සේවය කළ තරුණ අවධියේදී සිය රෝගීන්ගේ ජීවන අත්දැකීම් ඇසුරෙන් සමාජවාදී දෘෂ්ටිවාදය පිළිබඳව උනන්දුවක් දැක්වූ විතාරණ මහතා ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා මහතාගේ ඥාති පුත්‍රයකු ද වෙයි. දිවයිනෙහි අධිරාජ්‍ය විරෝධය වෙනුවෙන් විශාල වැඩ කොටසක් ඉටු කර, මැලේරියා මර්දනයට දායකත්වය සැපයූ මෙන්ම පොපිමල් වෙනුවට සූරියමල් ව්‍යාපාරය ආරම්භ කළ ලංකා වේ ප්‍රථම දේශපාලන පක්ෂය වන ලංකා සමසමාජ පක්ෂයට තිස්ස විතාරණ මහතා බැඳුණේ 1974දීය. අඛණ්ඩව මෙරට වාමාංශික දේශපාලනයට මැදිහත් වූ ඔහු වර්තමානයේ එම පක්ෂයේ මහ ලේකම්වරයාය. මහාචාර්ය තිස්ස විතාරණ, ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා, කොල්වින් ආර්. ද සිල්වා, බර්නාඩ් සොයිසා, ආචාර්ය ලෙස්ලි ගුණවර්ධන ආදී වාමාංශික නායකයන් රැසකගේ ඇසුර හිමිවූ මෙරට සිටින ජ්‍යෙෂ්ඨතම දේශපාලනඥයන් අතළොස්ස අතරින් අයෙකි.

2010 සිට පාර්ලිමේන්තුව නියෝජනය කළ ගරු තිස්ස විතාරණ මහතා කලක් විද්‍යා හා තාක්ෂණික කටයුතු අමාත්‍ය ධූරය දැරූ අතර ඉන් පසුවද විවිධ රජයන්හි වැදගත් තනතුරු රැසක් හෙබවූවේය. ඒ අතර මෙරට ජාතික ගැටලුව විසඳීම පිණිස පිහිට වූ සර්වපාක්ෂික කමිටුවේ සභාපති ධූරය මෙන්ම උතුරු මැද පළාත් ආණ්ඩුකාර ධූරය ද වෙයි.

# පොදු ව්‍යාපාර පිළිබද කාරක සභාවේ සභාපති ධූරයට මහාචාර්ය චරිත හේරත්



ජ්‍යෙෂ්ඨ රාජ්‍ය නිලධාරියෙකු, ශාස්ත්‍රඥයෙකු සහ ක්ෂේත්‍ර ගණනාවක ක්‍රියාකාරිකයෙකුව සිට නව වැනි පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරයෙකු ලෙස අභිනවයෙන් පත්වූ මහාචාර්ය චරිත හේරත් මහතා කෝප් කමිටුව හෙවත් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ සභාපති ධූරයට පත්ව සිටී. එතුමාගේ නම අමාත්‍ය මහින්දානන්ද අලුත්ගමගේ මහතා විසින් යෝජනා කළ අතර රාජ්‍ය අමාත්‍ය ජයන්ත සමරවීර මහතා විසින් ස්ථිර කරන ලදී.

මහාචාර්ය චරිත හේරත් 1995 වසරේ සිට මේ දක්වා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශනය හා මනෝ විද්‍යා අධ්‍යයන අංශයේ ආචාර්යවරයෙක් ලෙස දීර්ඝ කාලයක් සේවය කර අත්දැකීම් රැසක් ඇති ශාස්ත්‍රඥයෙකි. ඔහු පරිසර ආචාරධර්මීය දාර්ශනික ප්‍රවේශය (Conservation in Environmental Ethics) පිළිබඳව සිය ආචාර්ය උපාධිය ලබාගෙන තිබේ.

මූලික වශයෙන් ඔහුගේ ශාස්ත්‍රීය රුචිකත්වය කේන්ද්‍රව ඇත්තේ අද්‍යතන විශ්ලේෂණාත්මක දර්ශනය (Contemporary Analytical Philosophy) කෙරෙහි වන අතර ඔහුගේ ශෘස්ත්‍රීය පර්යේෂණ පසුකාලීනව විට්ගන්ස්ටයින්ගේ දර්ශනය සහ පරිසර ආචාරධර්ම පිළිබඳව (Later Wittgenstein's Philosophy and the Environmental Ethics) සිදුකර තිබේ.ආචාර්ය උපාධිය ලබාගැනීමට පෙර ඔහු ඇමෙරිකානු ෆුල්බ්‍රයිට් ශිෂ්‍යත්වයක් ලබා අමෙරිකාවේ ඔහයිඕ (Ohio) විශ්වවිද්‍යාලයෙන් සමාජ හා දේශපාලන දර්ශනය පිළිබඳ පශ්චාද් උපාධිය ලබාගෙන ඇති අතර චීනයේ සිචුආන් විශ්වවිද්‍යාලයෙන් චීන-ශ්‍රී ලංකා සම්බන්ධතා පිළිබඳ පශ්චාද් උපාධිය ද ලබාගෙන තිබේ. චරිත හේරත් මහතා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශන හා මනෝවිද්‍යා අධ්‍යයන අංශයේ අංශාධිපතිවරයා ලෙසද 2016 සිට 2018 කාලය තුළ කටයුතු කර ඇත.

ඊට පෙර ඔහු 2012 වසරේ ජූලි මස සිට 2015 වසරේ ජනවාරි දක්වා ජනමාධ්‍ය හා ප්‍රවෘත්ති අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයා වශයෙන් සේවය කර ඇති අතර, 2010 වසරේ මැයි මස සිට 2013 වසර දක්වා මධ්‍යම පරිසර අධිකාරියේ සභාපතිවරයා ලෙස ද කටයුතු කර තිබේ.

හෙතෙම එයට පෙර 2005 වසරේ සිට 2010 වසර දක්වා ජනමාධ්‍ය හා තොරතුරු අමාත්‍යාංශයේ උපදේශකවරයෙක් ලෙස ද දීර්ඝ කාලයක සේවා අත්දැකීම් ඇත්තෙකි.

**පුවත්**

# පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහයේ පළමු වෙළුම එළිදැක්වේ



පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් රචිත පාර්ලිමේන්තු ක්‍රියාවලිය පිළිබඳව තොරතුරු ඇතුළත් පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය සංග්‍රහයේ පළමු වෙළුම එළිදැක්වීම පසුගියදා පාර්ලිමේන්තුවේදී සිදු විය.

එහිදී පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා විසින් එහි පළමු පිටපත ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මහතා වෙත පිරිනැමීම සිදු කෙරිණි. ඉන්පසුව ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා, ගරු නියෝජ්‍ය කථානායක ආචාර්ය රංජිත් සියඹලාපිටිය මහතා, සභානායක දිනේෂ් ගුණවර්ධන මහතා, ආණ්ඩුවේ ප්‍රධාන සංවිධායක ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා සහ විපක්ෂයේ ප්‍රධාන සංවිධායක ලක්ෂ්මන් කිරිඇල්ල මහතා ඇතුළු මැති ඇමතිවරුන්ට එම ග්‍රන්ථය පිරිනැමීම සිදු කෙරිණි.

ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තු රීති සහ විනය, පාර්ලිමේන්තු ස්ථාවර නියෝග සහ මන්ත්‍රීවරයන් සඳහා වූ චර්යාධර්ම, නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය සහ පාර්ලිමේන්තු කමිටු ක්‍රමය, නව පාර්ලිමේන්තුවක ආරම්භක දිනයේ ක්‍රියාපටිපාටිය වැනි අංශ රැසක් පිළිබඳව කරුණු ගණනාවක් මෙම ග්‍රන්ථයට ඇතුළත්ව තිබේ. පාර්ලිමේන්තු සාර සංහිතා ශාස්ත්‍රීය ග්‍රන්ථයේ දෙවන වෙළුම ලබන දෙසැම්බර් මාසයේ දී එළි දැක්වීමට නියමිතය. ඊට අදාළ ලිපි භාර ගැනීම ඉදිරියේදී සිදු කෙරේ.

## පාර්ලිමේන්තුවේ ගෘහස්‍ය කාරක සභාවට සහ ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට සාමාජිකයන් පත් කෙරේ

ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් පාර්ලිමේන්තුවේ ගෘහස්‍ය කාරක සභාවට සහ ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට පත් කර ඇති මන්ත්‍රීවරයන්ගේ නාම ලේඛනය පාර්ලිමේන්තුවේ දී ප්‍රකාශයට පත් කරන ලදී.

ඒ අනුව අරුන්දික ප්‍රනාන්දු, නිමල් ලන්සා, කංචන විජේසේකර, පියල් නිශාන්ත ද සිල්වා, විශේෂඥ වෛද්‍ය සීතා අරඹේපොල යන අමාත්‍යවරයන් සහ ජේ.සී. අලවතුවල, මේජර් ප්‍රදීප් උඳුගොඩ, ජගත් කුමාර, කිංස් නෙල්සන්, මුදිතා ප්‍රිශාන්ති, නලින් ප්‍රනාන්දු, අලි සබ්රි රහීම්, මර්ජාන් ෆලීල්, ඩයනා ගමගේ යන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පාර්ලිමේන්තුවේ ගෘහස්‍ය කාරක සභාවට පත්කර තිබේ.

මෙයට අමතරව පහත දැක්වෙන මන්ත්‍රීවරයන් පාර්ලිමේන්තුවේ ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට පත්කර ඇත. එම සාමාජිකයන් වන්නේ එම්.යූ. එම්. අලි සබ්රි, විජිත බේරුගොඩ, කණක හේරත්, තාරක බාලසූරිය, අනුරාධ ජයරත්න, කබීර් හෂීම්, ආචාර්ය විජයදාස රාජපක්ෂ, ජී.ජී. පොන්නම්බලම්, ඒ.අරවින්ද් කුමාර්, වේලු කුමාර්, කෝකිලා ගුණවර්ධන, ප්‍රමිත බණ්ඩාර තෙන්නකෝන්, ශාන් විජයලාල් ද සිල්වා, සී.වී.විග්නේෂ්වරන්, ගෙවිඳු කුමාරතුංග, මහාචාර්ය රංජිත් බණ්ඩාර යන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ය.

## පාර්ලිමේන්තුව තවදුරටත් ඩිජිටල්කරණය වෙයි



පාර්ලිමේන්තුව ඩිජිටල්කරණය කිරීමේ තවත් පියවරක් ලෙස කාරක සභා කාමර අන්තර්ජාලය ඔස්සේ (ඔන්ලයින් ක්‍රමවේදය ඔස්සේ) වෙන්කරවා ගැනීමේ පහසුකම දැන් ක්‍රියාත්මකය.

පාර්ලිමේන්තුවේ තොරතුරු පද්ධති හා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මහේෂ් පෙරේරා මහතා විසින් පාර්ලිමේන්තුවේ සහකාර මහලේකම් ටිකිරි කේ. ජයතිලක මහතා ප්‍රමුඛ කාර්ය මණ්ඩලයට මේ පිළිබඳ හඳුන්වා දීම පසුගියදා සිදු කෙරිණ. e - අයදුම්පතක් වේත්‍රධාරී දෙපාර්තමේන්තුවට යොමු කිරීමෙන් කාරක සභා කාමර වෙන් කරවා ගැනීමේ පහසුකම මේ අනුව ක්‍රියාත්මක වේ.

කමිටු රැස්වීම්, උපදේශක කාරක සභා, ආණ්ඩු පක්ෂයේ හා විපක්ෂයේ රැස්වීම් ආදියට මෙම කාරක සභා කාමර වෙන්කර ගැනීමේ හැකියාව පවතී.

විශේෂාංග

# ශ්‍රී ලාංකේය පාර්ලිමේන්තු සම්ප්‍රදායන්




ශ්‍රී ලංකාව නිදහස් ස්වෛරී ස්වාධීන ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයකි. ජනරජයේ පරමාධිපත්‍ය ජනතාව කෙරෙහි පිහිටා ඇති අතර, ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ජනතාව විසින් තෝරාපත් කර ගනු ලබන මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත පාර්ලිමේන්තුව විසින් සහ ජනමත විචාරණයකදී ජනතාව විසින් ක්‍රියාත්මක කළ යුතු බව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළමු වැනි පරිච්ඡේදයේ සඳහන් වේ.

ජනරජය තුළ පවතින උත්තරීතරම ආයතනය හා මහජනතාවගේ පරමාධිපත්‍ය ක්‍රියාත්මක වන ස්ථානය පාර්ලිමේන්තුව වේ. පාර්ලිමේන්තුව සතු බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ලබා දී තිබේ. එමෙන්ම පාර්ලිමේන්තුවේ දෛනික කටයුතු කළ යුතු ආකාරය පිළිබඳ රීති මාලාවක් සාදා ගැනීමේ අනන්‍ය බලයක් පාර්ලිමේන්තුව සතු වේ. එම රීතීන් ස්ථාවර නියෝග ලෙස හඳුන්වයි. නමුත් එකී බලතල හා රීතීන්ට පරිබාහිරව පාර්ලිමේන්තු කටයුතු බොහොමයක් සම්ප්‍රදායන්, භාවිතයන් සහ පූර්වාදර්ශ අනුසාරයෙන් සකස් වී තිබේ.

1833 සිට බ්‍රිතාන්‍යයන් විසින් වරින්වර හඳුන්වා දී ඇති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් මඟින් මේ දක්වා පවතින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව දක්වා බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවේ ආභාසයන් ලබා ඇති බව නොරහසකි. ඒ අනුව බ්‍රිතාන්‍යයේ මහජන මන්ත්‍රී මණ්ඩලයෙහි සම්ප්‍රදායන් ද අප පාර්ලිමේන්තුවේ පැවැත්ම සඳහා බොහෝ සෙයින් බලපෑම් ඇති කර තිබේ. ඒ යටතේ,



**1. සෙංකෝලය**

පාර්ලිමේන්තුවේ සහ කථානායකවරයාගේ අණසක/ අධිකාරිය සංකේතවත් කරයි. මෙය ද වෙස්මිනිස්ටර් ක්‍රමය යටතේ අපට ලැබුණු දායාදයකි. එසේම වර්තමානයේ පාවිච්චි කරන සෙංකෝලය 1949 දී බ්‍රිතාන්‍ය මහජන මන්ත්‍රී මණ්ඩලයෙන් ලද පරිත්‍යාගයකි. සාම්ප්‍රදායිකව සභා රැස්වීම් ආරම්භක පටන් ගන්නා අවස්ථාවේ වේත්‍රධාරී විසින් සෙංකෝලය සභා ගර්භයේ තැන්පත් කරන අතර, සභාවේ කටයුතු අවසන් වූ විට එය සභාවෙන් ඉවත් කරයි. සෙංකෝලය හා බැඳුණු පාර්ලිමේන්තු සම්ප්‍රදායන් රැසක් ඇති අතර, පාර්ලිමේන්තු සැසියක් සෙංකෝලය රහිතව පැවැත්විය නොහැකි වීම සෙංකෝලය රැගෙන එන විට සියලු මන්ත්‍රීවරුන් සිය අසුන්වලින් නැඟී සිටීම, සෙංකෝලය තැන්පත් කිරීමේ දිශාව, කමිටු අවස්ථාවලදී සෙංකෝලය පහළ රඳවනයේ ස්ථානගත කිරීම ආදිය ඉන් ප්‍රධාන තැනක් ගනී. එසේ වුවත් සෙංකෝලය පිළිබඳව කිසිඳු සඳහනක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ ස්ථාවර නියෝගවල සඳහන් නොවීම ද කැපී පෙනෙන කාරණයක් වේ.

**2. මුලසුනට ගරු කිරීම**

සෙංකෝලය රැගත් වේත්‍රධාරී පෙරටු කොටගෙන කථානායකතුමා සහ ලේකම් මණ්ඩලය සභා ගර්භයට ප්‍රවිෂ්ට වන විට සභාව තුළ සිටින සියලු මන්ත්‍රීවරුන් නැගිට කථානායකතුමා අසුන් ගන්නා තෙක් සහ

සෙංකෝලය තැන්පත් කරන තෙක් නැඟී සිටී. සභා ගර්භයට ඇතුල් වන සහ පිට වන අවස්ථාවලදී මූලසුනට නැමී ආචාර කිරීම ද පිළිගත් සම්ප්‍රදායකි.



### 3. ඇඳුම

කථානායකතුමාට සහ සභා ගර්භය තුළ සිටින නිලධාරීන්ට නියමිත ඇඳුමක් තිබෙන අතර සභා ගර්භය තුළ දී එය ඇඳ සිටිය යුතුය. එසේම පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ද නියම කරන ලද ඇඳුමෙන් සැරසී සභාවට පැමිණීමට වගකීමක් තිබේ. යම් මන්ත්‍රීවරයකු නිසි ඇඳුමෙන් සැරසී නොමැත්තේ නම් ඔහුව නම් කර සභාවෙන් ඉවත් කිරීමට මූලසුනට බලයක් තිබේ. එසේම පාර්ලිමේන්තුව නැරඹීමට ගැලරියට පැමිණෙන අමුත්තන්ද නිසි ඇඳුමෙන් සැරසී සිටිය යුතුය. කථානායකතුමාගේ ගැලරියට ඇතුළත් කිරීමට නම් අමුත්තන් සියලු දෙනා සම්පූර්ණ යුරෝපීය හෝ ජාතික ඇඳුමින් සැරසී සිටිය යුතු ය.

### 4. සභා ගර්භය තුළ මන්ත්‍රීවරුන් හැඳින්වීම

සභා ගර්භය තුළ කටයුතු කරන අවස්ථාවලදී සහ විවාදයක් පවතින අවස්ථාවල දී අදාළ මන්ත්‍රීවරුන් හඳුන්වා දෙනු ලබන්නේ ඔවුන්ගේ ඡන්ද කොට්ඨාසයේ නාමයෙනි. ඒ "ගරු කැලණිය මන්ත්‍රීතුමා" වශයෙනි. නමුත් මෙම සම්ප්‍රදාය පාර්ලිමේන්තුව තුළින් සමානුපාතික ඡන්ද ක්‍රමය හඳුන්වාදීමත් සමගම වැළලී ගියේය. බ්‍රිතාන්‍ය, ඕස්ට්‍රේලියාව, කැනඩාව, දකුණු අප්‍රිකාව සහ ඉන්දියාව වැනි පාර්ලිමේන්තුවල තවදුරටත් මෙම සම්ප්‍රදාය පවතී. අගමැති, විපක්ෂ නායක, ඇමතිවරුන් සහ සභාවේ නිලයක් උසුලන තැනැත්තන්, එම නිලය මඟින් ආමන්ත්‍රණය කිරීම පිළිගත් සම්ප්‍රදායකි. ඒ අනුව "ගරු අගමැතිතුමා", "ගරු විපක්ෂ නායකතුමා", "ගරු සභානායකතුමා", "ගරු මුදල් ඇමතිතුමා" ලෙස ආමන්ත්‍රණය කිරීම සිදු වේ.

### 5. මන්ත්‍රීවරුන්ට ආසන පැනවීම

හුදෙක් මන්ත්‍රීවරුන්ට සභා ගර්භය තුළ ආසන පැනවීම ගරු කථානායකතුමාගේ කාර්යයක් වන අතර, සම්ප්‍රදායක් වශයෙන් කථානායකතුමාගේ දකුණු පස ආසනවල පාලක පක්ෂය ද, වම් පසට විපක්ෂය ද, අසුන් ගන්වයි. අගමැති, විපක්ෂ නායක සහ පාර්ලිමේන්තුවේ නිලතල දරන මන්ත්‍රීවරුන්ට විශේෂිත අසුන් වෙන් කරන අතර, ඇමතිවරුන්ට සහ විපක්ෂයේ ජ්‍යෙෂ්ඨ මන්ත්‍රීවරුන්ට සහ දේශපාලන පක්ෂ නායකයන්ට දෙපස ඉදිරි පෙළ අසුන් වෙන් කර තිබේ. සෙසු මන්ත්‍රීවරුන් සඳහා සම්ප්‍රදායක් ලෙස ආසන වෙන් කරනු ලබන්නේ ඔවුන්ගේ ජ්‍යෙෂ්ඨත්වය අනුවය.

### 6. පක්ෂ මාරු කිරීම

මින් අදහස් කරන්නේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන් විපක්ෂයට මාරු වීමත්, විපක්ෂයේ මන්ත්‍රීවරුන් ආණ්ඩු පක්ෂයට පිල් මාරු කිරීමත්ය. එබඳු අවස්ථාවකදී පිළිගත් සම්ප්‍රදාය වන්නේ කථානායකතුමාගේ විශේෂ අවසරයක් ඇතිව තමන්ට දැනට වෙන් කර ඇති ආසනයේ සිට ප්‍රකාශයක් කර පාර්ලිමේන්තුවේ සභා ගර්භය හරහා ගමන් කර අනෙක් පසට මාරු වීමයි.

### 7. පාර්ලිමේන්තුවට නොගැළපෙන වචන

පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් සභා ගර්භය තුළ විවාදයකට සහභාගි වෙද්දී හෝ යම් ප්‍රකාශයක් කරන විට ශිෂ්ට සම්පන්න භාෂාවකින් යොදාගත යුතු වේ. පාර්ලිමේන්තුවට නොගැළපෙන වචනවලින් ආමන්ත්‍රණය කළහොත් පළමු අවස්ථාවේදී එම වචනය ඉල්ලා අස් කර ගැනීමට එම මන්ත්‍රීවරයාට මූලසුනෙන් නියම කරයි. එසේ කිරීමට මන්ත්‍රීවරයා ප්‍රතික්ෂේප කරන්නේ නම් ඔහු මූලසුනේ අධිකාරිත්වයට / අණසකට යටත් නොවීම මත නම් කිරීමෙන් අනතුරුව සභා ගර්භයෙන් ඉවත් කළ හැකි අතර, සභාවට නොගැළපෙන වචන හෝ ප්‍රකාශය නිල වාර්තාවෙන් ඉවත් කිරීමට නියෝග කරයි.

### 8.රීති ප්‍රශ්න

සභා ගර්භය තුළ ඕනෑම අවස්ථාවක මන්ත්‍රීවරයකුට සභා රීතීන් කඩ වන්නේ යැයි විශ්වාස කරන විට රීති ප්‍රශ්නයක් මතු කිරීමට අවසරය තිබේ. රීති ප්‍රශ්නයක් මතු කළ විට ඒ සඳහා මූලසුනෙන් නියෝගයක් ලබා දිය යුතු වේ. නමුත් රීති ප්‍රශ්නයක් විවාදයක් බවට පත් කර ගත නොහැකිය. එසේ වුවද සම්ප්‍රදායක් ලෙස බෙදුම් සීනුව නාද වන විට, ඡන්දයක් විමසන අවස්ථාවේදී ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවේදී ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය එළි දක්වන විටදී හෝ මුදල් ඇමතිවරයා වාර්ෂික අයවැය ලේඛනය ඉදිරිපත් කරන විට සහ නවක මන්ත්‍රීවරයකු තම කුළුඳුල් කථාව පවත්වන විට බාධා කිරීමක් සිදු නොවේ.



*නීල් ඉද්දවල*
*නියෝජ්‍ය මහ ලේකම් හා*
*කාර්ය මණ්ඩල ප්‍රධානි*
*ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව*

**පුවත්**

# අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා 28 ක්

නවවැනි පාර්ලිමේන්තුවේ පළමු සභාවාරය සඳහා අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා 28 ක් පත් කෙරුණු අතර අදාළ විෂය භාර අමාත්‍යවරයා මෙම කාරක සභාවල සභාපතිවරයා ලෙස කටයුතු කරයි. ඊට අමතරව රාජ්‍ය අමාත්‍යවරයා, නියෝජ්‍ය අමාත්‍යවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් පස් දෙනෙකු ද ඊට ඇතුළත් ය.

මෙම එක් එක් අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ ගණපූරණය සාමාජික මන්ත්‍රීවරයන් තිදෙනෙකුගෙන් සංයුක්ත විය යුතුය. අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා පත් කිරීම පිළිබඳ තොරතුරු ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් පසුගියදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරිණි.

# උසස් නිලතල පිළිබඳ කාරක සභාව පත් කෙරේ

නව වන පාර්ලිමේන්තුවේ පළමුවන සැසිවාරය සඳහා පත්කළ උසස් නිලතල පිළිබඳ කාරක සභාව ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා පසුගියදා නිවේදනය කළේය. සාමාජිකයන් 18 දෙනෙකුගෙන් මෙම කමිටුව සමන්විතය. එහි සභාපතිවරයා වනුයේ කථානායකවරයාය.

ඒ අනුව චමල් රාජපක්ෂ, නිමල් සිරිපාල ද සිල්වා, දිනේෂ් ගුණවර්ධන, ජොන්ස්ටන් ප්‍රනාන්දු, ඩග්ලස් දේවානන්ද, බන්දුල ගුණවර්ධන, කෙහෙලිය රඹුක්වැල්ල, උදය ගම්මන්පිල, රමේෂ් පතිරණ, සුදර්ශනී ප්‍රනාන්දුපුල්ලේ, විදුර වික්‍රමනායක යන ගරු අමාත්‍යවරුන් ද, ජෝන් සෙනෙවිරත්න, අනුර ප්‍රියදර්ශන යාපා, විජිත හේරත්, රිෂාඩ් බදියුදීන්, තලතා අතුකෝරල, ෆීල්ඩ් මාෂල් සරත් ෆොන්සේකා යන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ද ස්ථාවර නියෝග 124 අනුව පත්කර තිබේ.

# නවවැනි පාර්ලිමේන්තුවට සෙත් පතා බෝධි පූජාමය පින්කමක්



නවවැනි පාර්ලිමේන්තුවේ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාට, තේරී පත් වූ සියලු මන්ත්‍රීවරයන්ට සහ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයට සෙත් පතා මහා සංඝරත්නයේ සහභාගිත්වයෙන් පාර්ලිමේන්තු පරිශ්‍රයෙහි වැඩ සිටින ජය ශ්‍රී මහ බෝධීන් වහන්සේ අබියස බෝධි පූජාමය පින්කමක් පැවැත්විණි.

කොළඹ කඩවත්සතරේ ප්‍රධාන සංඝනායක, ධර්මදූතාශ්‍රම විද්‍යාලයීය පිරිවෙනෙහි කෘත්‍යාධිකාරී කිරින්දේ පඤ්ඤාතිස්ස හිමි, රාගම වල්පොල විද්‍යා නිවාස මහ පිරිවෙනෙහි පරිවේනාධිපති ශාස්ත්‍රපති පණ්ඩිත ගලහ පඤ්ඤාසාර හිමි, ඇමරිකාවේ ජෝර්ජීය බෞද්ධ විහාරාධිපති පනම්වෙල වජිරබුද්ධි හිමි, කොළඹ 10 පන්සලවත්ත ශ්‍රී බෞද්ධාරාමාධිපති, සද්ධර්ම කීර්ති ශ්‍රී ශාසන ශෝභමානී, ශාස්ත්‍රවේදී ලුණුගම්වෙහෙරේ විමලානන්ද හිමි යන හිමිවරු මෙම බෝධි පූජාමය පින්කම සඳහා පාර්ලිමේන්තු පරිශ්‍රයට වැඩම කළහ.

මෙහිදී අතිපූජ්‍ය මහා සංඝරත්නය විසින් නවවැනි පාර්ලිමේන්තුව සාර්ථකව මෙහෙයවීමට කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා සහ මන්ත්‍රීවරයන් වෙත නිසි මාර්ගෝපදේශනය ද ලබාදෙමින් අනුශාසනාවක් ද පැවැත්වීමට කටයුතු යෙදිණ.

එම අවස්ථාවට පාර්ලිමේන්තු මහලේකම් ධම්මික දසනායක මහතා, කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහ ලේකම් නීල් ඉද්දවල මහතා ඇතුළු කාර්ය මණ්ඩලය සහභාගි වූහ. මෙම ආශිර්වාදාත්මක බෝධි පූජා පින්කම සංවිධානය කරන ලද්දේ පාර්ලිමේන්තු කාර්ය මණ්ඩලයීය බෞද්ධ සංගමය විසිනි.

විශේෂාංග

# ඉදිරිගාමී ගමනක නිරත පාර්ලිමේන්තු පුස්තකාලය

දිගු අතීතයකට හිමිකම් කියන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ පුස්තකාලය ජනතා අභිලාෂ ඉටු කිරීමට කැපවීමෙන් සේවය කරන මන්ත්‍රීවරයන්ගේ බුද්ධිමය අවශ්‍යතාවය උපරිමයෙන් ඉටු කිරීමට දායකත්වය සපයන අංශයකි. මන්ත්‍රීවරයන්ගේ අවශ්‍යතාවයට අදාළ පරිදි නිරවද්‍ය, වැදගත් සහ යාවත්කාලීන තොරතුරු හැකි ඉක්මනින් ලබා දීම පුස්තකාල කාර්ය මණ්ඩලයේ වගකීමයි.

**පුස්තකාලයේ ඓතිහාසික පසුබිම**

1833 දී ව්‍යවස්ථාදායක සභාව ස්ථාපිත කිරීම ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසයේ ප්‍රධාන කඩඉමක් මෙන්ම මං සලකුණකි. ව්‍යවස්ථාදායක සභාව ආරම්භ කර සුළු කලෙකින් පුස්තකාලයක අවශ්‍යතාවය පිළිබඳව මන්ත්‍රීවරුන් අතර සංවාදයක් ඇතිවිය. එහි ප්‍රතිඵලයක් ලෙස 1922 ජූලි මස 20 වන දින නැගෙනහිර පළාත නියෝජනය කළ මන්ත්‍රී ගරු ඊ.ආර් තම්බිමුත්තු මහතා සභාවේ මන්ත්‍රීවරුන්ගේ පහසුව තකා පුස්තකාලයක් ස්ථාපනය කළ යුතු බවට යෝජනාවක් ව්‍යවස්ථාදායක සභාවට ඉදිරිපත් කළේය. උතුරු පළාතේ මන්ත්‍රී ගරු ඩබ්. දොරේසාමි මහතාගේ ස්ථිරත්වයෙන් ව්‍යවස්ථාදායක සභාවේ සාමාජිකයන්ගේ තොරතුරු අවශ්‍යතා සපුරාලීම සඳහා පුස්තකාලයක් ගොඩනැගිය යුතුය යන යෝජනාව සභා සම්මත කෙරිණි.

එවකට වැඩ බලන යටත්විජිත භාර ලේකම්වරයා වශයෙන් කටයුතු කළ බී.හෝස්බර්ග් මහතාද පාර්ලිමේන්තුවට පුස්තකාලයක ඇති වැදගත්කම පිළිගත් අතර, ඉදිරියේදී ඉදිකිරීමට නියමිත නව ව්‍යවස්ථාදායක ගොඩනැගිල්ලේ සැලැස්මට පුස්තකාලයක්ද එකතු කිරීමට තීරණය කළේය. පූර්ව යටත්විජිත පාලන සමයට අයත් සමාජ හා දේශපාලනිකමය වශයෙන් වැදගත් ලේඛන රැසකින් සමන්විත අභිනව පුස්තකාලය හඳුන්වන ලද්දේ ව්‍යවස්ථාදායක මණ්ඩලයීය පුස්තකාලය නමිනි. අනතුරුව, රාජ්‍ය මන්ත්‍රණ සභාව ඇති කළ පසු ව්‍යවස්ථාදායක සභාව අහෝසි වී ගිය ද පුස්තකාලය තව දුරටත් ව්‍යවස්ථාදායක සභාවේ පුස්තකාලය වශයෙන්ම හඳුන්වනු ලැබිණ.

මෙරට ඇතිවූ ව්‍යවස්ථාමය වෙනස්කම් නිසා, රාජ්‍ය මන්ත්‍රණ සභාවටම සේවය කරන ලද පුස්තකාලය නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ පුස්තකාලය බවට පත් වූ අතර, සෙනෙට් මන්ත්‍රී මණ්ඩලය සඳහා නව පුස්තකාලයක් සෙනෙට් ගොඩනැගිල්ලේ ආරම්භ කරන ලදී. සෙනෙට් සභාව අහෝසි වූ පසුව, සෙනෙට් සභා පුස්තකාලය සතු වූ සම්පත් නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ පුස්තකාලයට එකතු කරන ලදී. 1972 මැයි 22 දා සිට ක්‍රියාත්මක කරන ලද නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟින් ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් වීමෙන් පසු එම පුස්තකාලය ජාතික රාජ්‍ය සභාවේ පුස්තකාලය බවට පත් විය. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව ලෙස නම් කරන ලද්දේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මඟිනි. මේ අනුව ව්‍යවස්ථාදායක පුස්තකාලය පාර්ලිමේන්තු පුස්තකාලය යනුවෙන් සංශෝධනය විය.

**පුස්තකාලයේ වත්මන් තතු**

ගරු මන්ත්‍රීවරයන්ට ඉක්මනින් ප්‍රවේශ වීමේ හැකියාව සහිතව වත්මන් පාර්ලිමේන්තු ගොඩනැගිල්ලේ පළමුවැනි සහ දෙවැනි මහලේ පුස්තකාලය ස්ථානගත කර තිබේ. ගරු මන්ත්‍රීවරයකු සභාගර්භයේ විවාදයකට සම්බන්ධය සිටියදී කොරතුරක් අවශ්‍ය වන්නේ නම්, පුස්තකාලයාධිපති වෙත සටහනක් යැවීමෙන් එම කටයුත්ත ඉටු කරගත හැකිය.



එහි දේශපාලන විද්‍යාව, ජාත්‍යන්තර කටයුතු, ආර්ථිකය, නීතිය, රාජ්‍ය පරිපාලනය, සමාජ සුභසාධනය, අධ්‍යාපනය, ඉතිහාසය, භූගෝලය හා ආගම ආදී විෂයයන්ට විශේෂ අවධාරණයක් සහිතව සියලුම

දැනුම් ක්ෂේත්‍ර ආවරණය වන පරිදි සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන ත්‍රෛභාෂාවෙන්ම රචිත කෘති අන්තර්ගත වේ. මෙම කෘති ඩිවි දශම ක්‍රමයට වර්ගීකරණය කර පරිගණකගත කර ඇත. ඊට අමතරව, පාර්ලිමේන්තු පුස්තකාලය නවීන සන්නිවේදන උපකරණවලින් හා අන්තර්ජාල පහසුකම්වලින් ද සමන්විත වනුයේ කාර්යක්ෂමව, නිරවද්‍ය තොරතුරු සැපයීමේ සිය මෙහෙවරට උරදෙනු පිණිසය.

එමෙන්ම, 1991 දී පාර්ලිමේන්තු පුස්තකාලයට පර්යේෂණ අංශයක් එක් කරන ලද්දේ ජාතික හා ජාත්‍යන්තර පුස්තකාල සමඟ සම්බන්ධතා ගොඩ නගාගනිමින් ලොවට නිකුත්වන නවතම තොරතුරු අනුසාරයෙන් කාලීන මාතෘකා යටතේ පර්යේෂණ වාර්තා සකස් කර දෙමින් මහජන නියෝජිතයන්ට සහාය වීම අරමුණු කරගනිමිනි. පාර්ලිමේන්තු වෙබ් අඩවිය ද පාර්ලිමේන්තු පුස්තකාලය පිළිබඳව පරිපූර්ණ විස්තරයක් සපයන අතර, ග්‍රන්ථ සම්බන්ධව පමණක් නොව ආරම්භයේ සිට මේ දක්වා තේරී පත්වූ පාර්ලිමේන්තුව නියෝජිතයන් පිළිබඳ තොරතුරු ද අන්තර්ජාලයට එක් කර තිබේ. එහෙයින්, පාර්ලිමේන්තු පුස්තකාලයේ තොරතුරු ලබා දීමේ සේවයේ වත්මන් තත්ත්වය ඉතා ඉහළ ගුණාත්මක මට්ටමක පවතී. එසේම, පාර්ලිමේන්තු පුස්තකාලය සතු ඉපැරණි, මහඟු ලේඛන ඩිජිටල්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ 1880 සිට නිකුත් කළ විවිධ ලේඛනවල පිටු දස ලක්ෂ තුනක් සංරක්ෂණය කිරීමට කටයුතු කර ඇත. ඉදිරියේදී සාමාන්‍ය ජනතාවටද පාර්ලිමේන්තු වෙබ් අඩවිය හරහා මෙම ලේඛන පරිශීලනය කිරීමේ සුවිශේෂි අවස්ථාව උදාවනු ඇත.



**ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ප්‍රථම පුස්තකාලධිපතිනිය**
පාර්ලිමේන්තු පුස්තකාලය ආරම්භයේ එහි ප්‍රථම පුස්තකාලයාධිපති වූ කළුපහන විතානගේ දොන් විල්සන් පෙරේරා මහතාගේ සිට වසර 93ක් ගෙවී යද්දී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ප්‍රථම පුස්තකාලයාධිපතිනිය වීමේ ගෞරවය හිමිවූ පුස්තකාලයාධිපතිනිය වූ රුක්මලී සේපාලිකා මෙනවිය හිමි කරගත්තාය.

පන්නිපිටිය ධර්මපාල විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හැදෑරූ ඇය පුස්තකාල විද්‍යාව පිළිබඳව උපාධිධාරිනියක් වන අතර එම විෂයානුබද්ධව පශ්චාත් උපාධියකද හිමිකාරිනියකි. උපාධිධාරිණියක වන ඇය 1999 වර්ෂයේදී පාර්ලිමේන්තුවේ කනිෂ්ඨ සහකාර පුස්තකාලාධිපතිනිය ලෙස සේවයේ පිහිටුවන ලද අතර, ඉන් අනතුරුව 2007 වර්ෂයේදී සහකාර පුස්තකාලයාධිපතිනිය ලෙසත්, 2014 වර්ෂයේදී නියෝජ්‍ය පුස්තකාලයාධිපතිනිය ලෙසත්, 2020 පෙබරවාරි 05 වන දින පාර්ලිමේන්තු පුස්තකාලයාධිපතිනිය ලෙසත් උසස්වීම් ලද්දාය.




පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලයේ දැක්මට සරිලන ලෙසින්, මහජන නියෝජිතයන්ගේ, රජයේ සහ ව්‍යවස්ථාදායකයේ ඉල්ලීම් කාර්යක්ෂම, ඵලදායී එමෙන්ම යාවත්කාලීන තොරතුරු සපුරාලමින්, පර්යේෂණ හා විශ්ලේෂණ මගින් අවශ්‍ය සේවා සපයමින්, පාර්ලිමේන්තු කාරක සභාවලට, මෙන්ම මහජනයාටද සේවය සලසාදෙන පාර්ලිමේන්තු පුස්තකාලය රටේ සමස්ත පාලනමය ක්‍රියාවලිය සඳහා දක්වන දායකත්වය ප්‍රශංසනීය වේ.

***දුමින්ද වික්‍රමසිංහ***
***මහජන සේවා නිලධාරී***
***සන්නිවේදන දෙපාර්තමේන්තුව***

පුවත්

# ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස්වරයා සහ ගරු කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා අතර හමුවක්



ශ්‍රී ලංකාවේ ඉන්දියානු මහ කොමසාරිස් ගෝපාල් භාග්ලේ මහතා පසුගියදා ශ්‍රී ලංකාවේ ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා මුණගැසුණේය. පාර්ලිමේන්තු සංකීර්ණයේ පැවති මෙම අවස්ථාවට පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා ද සහභාගී විය. මෙම හමුවීමෙන් පසු කථානායකතුමා විසින් ඉන්දියානු මහ කොමසාරිස්වරයා වෙනුවෙන් තේ පැන් සංග්‍රහයක්ද පැවැත්වීය.

මෙය කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා පාර්ලිමේන්තුවේ කථානායකවරයා වශයෙන් පත්වීමෙන් අනතුරුව පැවති පළමු රාජතාන්ත්‍රික හමුවයි.

# ඇමරිකා එක්සත් ජනපද තානාපතිනිය ගරු කථානායක මුණගැසේ



ශ්‍රී ලංකාවේ සහ මාලදිවයිනේ ඇමරිකා එක්සත් ජනපද තානාපතිනි ඇලයිනා ටෙප්ලිට්ස් මහත්මිය පසුගියදා ගරු කථානායක  මහින්ද යාපා අබේවර්ධන මහතා මුණගැසුණාය.

මෙම අවස්ථාවට ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ ඇමරිකානු ඒජන්සියේ  ශ්‍රී ලංකාවේ අධ්‍යක්ෂ රීඩ් අයෙෂිමාන් මහතා සහ තානාපති කාර්යාලයේ දේශපාලන නිලධාරී ජෙෆ්රි ෂැනිං මහතාද සහභාගී වූහ. මෙම හමුවට පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා ද එක්විය.

# පලස්තීනයේ තානාපතිවරයා සහ කථානායකතුමා අතර සුහද හමුවක්



ශ්‍රී ලංකාවේ පලස්තීන තානාපති සුහේර් මොහොමඩ් හම්දල්ලා මහතා සහ පාර්ලිමේන්තුවේ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා අතර සුහද හමුවක් පසුගියදා පාර්ලිමේන්තු සංකීර්ණයේදී පැවැත්විණි. මෙම අවස්ථාවට පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා ද සහභාගී විය.

සුහද හමුවෙන් අනතුරුව කථානායකතුමා විසින් පලස්තීන තානාපතිවරයා ඇතුළු අමුත්තන් වෙත තේ පැන් සංග්‍රහයක්ද පිරිනමන ලදී.

# මැතිසබය දිනූ කතුන්



ශ්‍රී ලංකාව 1931දී සර්වජන ඡන්ද  බලය ලබාගත් රටක් වන අතර කාන්තාවන්ට ඡන්ද  බලය ලබාදීම අතින් සමහර බටහිර රටවලටද වඩා ඉදිරිගාමී එකකි. 1960 දී ලොව ප්‍රථම කාන්තා අගමැතිනිය බිහි කළ ලංකාව එවකට හැඳින්වූයේ තෙවෙනි ලෝකයේ ප්‍රජාතන්ත්‍රවාදී ආදර්ශක රාජ්‍යයක් ලෙසිනි.

1994 දී චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග මැතිනිය පළමු විධායක ජනාධිපතිනිය ලෙස තේරී පත්වීමද මෙවැනිම සුවිශේෂ ගණයේ සිදුවීමකි. දකුණු ආසියාතික සන්දර්භයේදී දේශපාලනය හැර වෙනත් දර්ශක සම්බන්ධයෙන් ද මෙරට කාන්තාවන් සිටියේ ඉහළ මට්ටමකිනි. නිදසුනකට, ආයු අපේක්ෂාව අතින් ලාංකික පුරුෂයන්ට වඩා කාන්තාවන් දීර්ඝ ආයු කාලයක් භුක්ති විඳිති.

එපමණක්  නොව, 1931 තරම් ඈත අතීතයේ සිට ශ්‍රී ලංකාවේ අවුරුදු විසි එකට වැඩි ගැහැනු පිරිමි දෙකොටසටම ඡන්ද බලය ලැබීමෙන් පසු ආචාර්ය ඇන්.ඇම්. පෙරේරා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් තෝරාගැනීමේදී “පුද්ගලික තත්ත්වය සහ වටිනාකම බෙහෙවින් බලපැවැත්වුණ බව” සඳහන් කළද ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය ක්‍රියාත්මක වීමෙන් කෙටි කලකින් අනතුරුව රාජ්‍ය මන්ත්‍රණ සභාවට පළමු කාන්තාව පත්වීම අපගේ මැතිවරණ ඉතිහාසයේ කාන්තාවන් අත්පත් කරගත් ස්වර්ණමය අවස්ථාවක් ලෙස හැඳින්විය හැකිය. ඈ අදටත් කෑගල්ලේ දනන් තුඩග කියවෙන නමකට හිමිකම් කියන ගෞරවනීය මන්ත්‍රීවරියක් වන ඇඩ්ලින් මොලමුරේ මැතිනියයි.

**පිය උරුමයෙන් දේශපාලනයට පිවිසි ඇඩ්ලින් මොලමුරේ**

1890 වසරේ සැප්තැම්බර් මස පළමුවැනිදා මෙරට ප්‍රභූ පවුලකට දාව උපත ලද ඇඩ්ලින් මීදෙනිය අගනුවර බිෂොප් විද්‍යාලයෙන් අධ්‍යාපනය හැදෑරුවාය. ඇගේ පියා වූ ජෝන් හෙන්රි මීදෙනිය අදිකාරම 1931 මැයි මස හතර වැනිදා ඩොනමෝර් ආණ්ඩු ක්‍රමය යටතේ පිහිටුවන පළවෙනි රාජ්‍ය මන්ත්‍රණ සභාව සඳහා නාම යෝජනා පත් භාරදුන්නේය. එම මැතිවරණයේදී රුවන්වැල්ල ආසනය සඳහා කම්කරු පක්ෂයෙන් අපේක්ෂකයා වූ මීදෙනිය අදිකාරම පත්වූයේ නිතරගයෙනි. එනමුත්, ඔහු සභාවෙහි කටයුතු කළ කාලය සිවු මසක් හා එක් දිනකට සීමාවිණි. ඔහුගේ ආධාරකරුවන් අනපේක්ෂිත ලෙස ශෝකාග්නියෙහි ගිල්වමින් සැප්තැම්බර් 05 වැනි දින හෙතෙම අභාවයට පත්විය. ඔහුගේ දියණිය එනම්, විවාහයෙන් ඉක්බිතිව ඇඩ්ලින් මොලමුරේ පියාගේ සමීපස්ථ ආධාරකරුවන්, කාන්තා සමිති ඇතුළු තවත් සංගම් කීපයක ඉල්ලීම හේතුවෙන්, සිය පියාගෙන් හිස් වුණු රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අසුන පිරවීම සඳහා පැවැත්වෙන අතුරු මැතිවරණයට තරඟ කිරීමට තීරණය කළාය.  තම පියාගෙන් මෙන්ම එවකට රාජ්‍ය මන්ත්‍රණ සභාවේ සභාපති ලෙස කටයුතු කළ ඇගේ සැමියාගේ දේශපාලන ගමනද ඒ තීරණය ගැනීමට ඉවහල් වූ බව නිසැකය. එසේ රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ප්‍රථම අතුරු මැතිවරණයට සහභාගී වූ පළමුවෙනි ජයග්‍රාහී කාන්තාව වෙමින් ඇඩ්ලින් මොලමුරේ මෙරට කාන්තාවන්ගේ  අනාගතය වෙනස් කළාය.



*මීදෙනියේ අධිකාරම් සිය පුතණුවෝ සහ දියණියන් වන ඇඩ්ලින් සහ ඇලිස් සමඟ*

සර්වජන ඡන්ද බලය හිමිවීමත් සමඟ 1931 දී පවත්වන ලද ප්‍රථම රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණයෙන් පසුව පැවති රුවන්වැල්ල අසුන සඳහා වූ අතුරු මැතිවරණයේදී ඡන්ද 13,866 ලබාගැනීමට ඇයට හැකිවිය. එම අසුනට පත්වීමෙන් පසු ඇඩ්ලින් මොලමුරේ මහත්මිය මෙරට ප්‍රථම පාර්ලිමේන්තු මන්ත්‍රීවරිය ලෙස ඉතිහාසයට එක් වූවාය. ස්වකීය

දේශපාලන ආගමනය පවුල් උරුමයෙන් ඇරඹූ මොලමුරේ මහත්මිය පසුව සක්‍රිය දේශපාලනයට පිවිස, 1936දී දෙවැනි රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණය පැවැත්වෙන තුරු රුවන්වැල්ල ආසනය අඛණ්ඩව නියෝජනය කළාය. ඇයගේ පත්වීම මෙරට කාන්තාවන්ට කෙතරම් ආනුභාවසම්පන්න වී ද යත්, වසරක් ගතවීමට පෙරාතුව තවත් කාන්තාවක් රාජ්‍ය මන්ත්‍රණ සභාවට ප්‍රවේශ වනු පිණිස අතුරු මැතිවරණයකට අවතීර්ණ වූවාය.



මොලමුරේ මැතිනිය, රාජ්‍ය මන්ත්‍රණ සභාවේ කෘෂිකර්ම හා ඉඩම් අමාත්‍යාංශයේ විධායක කාරක සභාවේ සාමාජිකාවක වූවාය. එක්සත් ජාතික පක්ෂය පිහිටුවීමෙන් පසුව ඇය එහි සාමාජිකත්වය ලබාගත් අතර 1947 වසරේදී පිහිටවූ සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයටද පත් වූවාය. එතැන් සිට සෙනෙට් මන්ත්‍රීවරියක වීමේ අවස්ථාව ඇයට ලැබිණි. 1948 වසරේදී එක්සත් ජාතික පක්ෂයේ කාන්තා පෙරමුණේ ප්‍රථම සභාපතිවරිය බවට පත්වූ ඈ වසර හයක්ම එම තනතුර දැරුවාය. පසුව, 1950 වසරේදී අන්තර් ජාතික කාන්තා සංවිධානයේ ශ්‍රී ලංකා ශාඛාවේ සභාපතිනිය වශයෙන්ද වසර හයක් සේවය කළාය.

මොලමුරේ මැතිනිය විදේශීය බුහුමනට පවා පාත්‍ර වූ සුවිශිෂ්ට ලාංකික කාන්තාවකි. 1950 වසරේදී බ්‍රිතාන්‍යයේ




නව නියෝජිත මන්ත්‍රී මණ්ඩලය, හයවැනි ජෝර්ජ් රජතුමා විසින් විවෘත කිරීමේ මහෝත්සවයට සහභාගි වූ එකම ශ්‍රී ලාංකික කාන්තාව වන්නේද ඇඩ්ලින් මොලමුරේ ආර්යාවය.1953 වසරේදී පැවැති අන්තර් පාර්ලිමේන්තු සම්මේලනයට සහභාගි වූ ශ්‍රී ලාංකේය නියෝජිතයන් අතරට ද ඇය එක්ව සිටියාය. එහිදී ඉන්දියානු පුරවැසි ගැටලුව සම්බන්ධයෙන් අවධානයට ලක් කර ඇය සැමගේ ගෞරවාදරයට පාත්‍ර වූවාය. සිය දේශපාලන දිවියෙහි විජයග්‍රහණය සටහන් කරමින්, 1956 වසරේදී ඇඩ්ලින් මොලමුරේ සෙනෙට් මන්ත්‍රී මණ්ඩලයේ උප සභාපති තනතුරට පත් වූයේ ඒකඡන්දයෙනි. දේශපාලන දිවියෙන් සමුගැනීමෙන් පසු පොදු සමාජ සේවා කටයුතුවල නියැළෙමින් කාලය ගත කළ ඈ 1977 වසරේ ජූලි මස 27 වැනි දින මෙලොවින් වෙන්ව ගියේ ලාංකික කාන්තා පරපුර වෙත දේශපාලනයෙහි උරුමකම් කියන්නට අතිශය සුවිසෙස් කීර්ති කදම්භයක් ශේෂ කරලමිනි.

රාජ්‍ය මන්ත්‍රණ සභාවට කොළඹින් ආ **නේසම් සරවනමුත්තු මැතිනියගේ** දේශපාලන ආගමනය ලබන කලාපයෙන් බලාපොරොත්තු වන්න.

***ඉෂාරා වික්‍රමසිංහ***
***මහජන සේවා නිලධාරී***
***සන්නිවේදන දෙපාර්තමේන්තුව***

විශේෂාංග

# පාර්ලිමේන්තු හැන්සාඩ් වාර්තාව ගැන හැඳින්වීමක් හා හැන්සාඩ් වාර්තා




## පළමුවන වෙළුම

සාමාන්‍ය හැන්සාඩ් වාර්තාවකට වඩා හැන්සාඩ් වාර්තාවක පළමු කලාපයක්ද, ඊටත් වඩා පළමු වෙලුමක පළමු කලාපයක්ද වැඩි වටිනාකමක් දරන්නේ එහි අන්තර්ගතයේ පවත්නා තොරතුරුවල බරසාරත්වය නිසාවෙන් ම ය. ප්‍රජාතන්ත්‍රවාදයේ මුදුන් මල්කඩ ලෙසට හඳුන්වන පාර්ලිමේන්තුව, තාක්ෂණයේ දියුණුව හා සමාජයේ දියුණුව හමුවේ ඊට ගැලපෙන පරිදි යාවත්කාලීන වෙමින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට හා ස්ථාවර නියෝගවලට අනුකූලව එහි විෂය පථය (scope) පුළුල් වෙමින් හැඩය, ස්වරූපය (form) වෙනස් කර ගන්නා සෑම අවස්ථාවකදීම හැන්සාඩ් වාර්තාවද ඊට ගැලපෙන ලෙස පළමුවන වෙලුමක් හා ඊට අදාළ පළමු කලාපයක් ප්‍රකාශයට පත් කරමින් ඒ ගැන සමාජය දැනුවත් කිරීමේ කාර්ය භාරය නොපිරිහෙළා ඉටු කර ඇති බව පසුගිය හැන්සාඩ් වාර්තා පරිශීලනය කිරීමේදී පෙනී යයි.

කෙනෙකුගේ රාජකාරියට අවශ්‍ය වන සෑම තොරතුරක්ම තම මතකයේ තබා ගත නොහැකි වන බැවින් තොරතුරු මතක තබා ගැනීම මෙන්ම ක්ෂණිකව තොරතුරුවලට ප්‍රවේශ වන මාර්ග පිළිබඳව දැනුවත්වීමද තම කාර්යක්ෂමතාව වර්ධනය කර ගැනීමට අවශ්‍ය සාධකයකි. එමෙන්ම යම් ක්ෂේත්‍රයක කටයුතු කිරීමේදී එහි ඉතිහාසය දැන සිටීමෙනුත් තම කාර්යය පහසු කරවයි. ඒ අනුව හැන්සාඩ් වාර්තා පිළියෙල වීමේ ස්වභාවය පිළිබඳව ඔබ දැනුවත්වීම එහි තොරතුරුවලට ප්‍රවේශවීම පහසු කරවන්නකි.

දැනට පවත්නා හැන්සාඩ් වාර්තාවලට අනුව පළමුවන වෙලුමක් 1924 වර්ෂයේ පළ කොට ඇත. පසුව 1933 වර්ෂයේ සිට 1947 වර්ෂය දක්වා වූ රාජ්‍ය සභා කාල පරිච්ඡේදවල (පළමුවන රාජ්‍ය සභාව 1931-1935, දෙවන රාජ්‍ය සභාව 1936-1947) සෑම වසරකම පළමුවන වෙලුමක් ප්‍රකාශයට පත් කොට ඇති බව පෙනේ. ඉන් පසු පාර්ලිමේන්තු - නියෝජිත මන්ත්‍රී මණ්ඩලය 1947 දී පිහිටුවීමේ අවස්ථාවේදීත්, 1972 දී ජාතික රාජ්‍ය සභාව පිහිට වූ අවස්ථාවේදීත් සහ 1978 වසරේ ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව ආරම්භ කළ අවස්ථාවේදීත් මෙලෙසින් හැන්සාඩ් වාර්තාවේ අලුත් වෙලුමක් ආරම්භ කොට ඇත. එසේ 1978 වසරේ ආරම්භ කළ පළමුවන වෙලුමට අදාළ 276 වන වෙලුම් කාණ්ඩයේ 6වන කලාපය 2020 පෙබරවාරි මස 06 වන දිනයේදී එනම් අටවන පාර්ලිමේන්තුවේ අවසන් දිනයේදී ප්‍රකාශයට පත් විය. එසේ හැන්සාඩ් වාර්තාවක එක් එක් වෙලුම්වලට අදාළව ප්‍රකාශයට පත් වන පළමුවන කලාපයක අන්තර්ගතය වැදගත් ප්‍රධාන කරුණු රාශියකින් සමන්විතය. එවකට පවතින පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය (ආසනය, ජාතික ලැයිස්තුවෙන් ද යන්න මෙන්ම සභිකයෙක් වෙනුවට ආදේශ කිරීමක් නම් ඒ ආදේශ කළ දිනය ද සඳහන් කරමින්) අමාත්‍ය මණ්ඩලය, කැබිනට් නොවන අමාත්‍යවරු, රාජ්‍ය අමාත්‍යවරු, නියෝජ්‍ය අමාත්‍යවරු ඇතුළත් ලේඛනය, සභාපති නාමාවලිය, පාර්ලිමේන්තු කාරක සභා, අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා, විශේෂ කාරක සභා සමන්විත වන සභික ලැයිස්තුව සහ ඒ ඒ අංශවලට අදාළ පාර්ලිමේන්තු නිලධාරීන්ගේ නාම ලේඛනයක් වැනි කාලීනමය වටිනාකමක් ඇති තොරතුරු භාෂාත්‍රයෙන් මෙම විශේෂිත හැන්සාඩ් වාර්තාවට ඇතුළත් වී තිබෙන්නේ එදින පාර්ලිමේන්තු සභා ගර්භයේ සිදු වුණු දෑට අමතරවය.

පළමුවන කලාපයක් ප්‍රකාශයට පත් කරන සෑම අවස්ථාවකදී ඊට අන්තර්ගත කරන පොදු විස්තරය යාවත්කාලීන කෙරෙන හෙයින් ඔබට යම් දිනක විශේෂ කාරක සභාවක සාමාජිකයන්ගේ හෝ අමාත්‍යවරයෙකුගේ ධුරයක් (portfolio) වැනි තොරතුරක් සම්බන්ධයෙන් විස්තරයක් දැන ගැනීමට අවශ්‍ය වේ නම් බැලිය යුතු වන්නේ ප්‍රකාශයට පත් වූ නවීනතම පළමුවන කලාපය යි. අප රටට නිදහස ලැබීමට පෙර වර්ෂයේ දී ශ්‍රී ලංකාවේ පළමු පාර්ලිමේන්තු - නියෝජිත මන්ත්‍රී මණ්ඩලය රැස්වී ඇත. ඒ 1947 ඔක්තෝබර් 14 වන අඟහරුවාදා පූර්ව භාග 10.00ට ය. එදිනට අදාළවත් පළමු වෙලුමක පළමු කලාපයක් ප්‍රකාශයට පත් කර ඇත.

එදින Clerk to the House of Representatives (අද්‍යතන පාර්ලිමේන්තුවේ එම ධුරය පාර්ලිමේන්තුවේ මහලේකම් ධුරයයි). ධුරය හෙබවූ රැල්ෆ් සෙන්ට් ලුවිස් පීරිස් දැරනියගල මහතා විසින් ආණ්ඩුකාරවරයා විසින් එවන ලද සභාව රැස්වීමේ නිවේදනය ප්‍රකාශයට පත් කිරීමෙන් අනතුරුව සභාවේ මූලික කටයුත්ත වී ඇත්තේ කථානායකවරයෙකු තේරීමය. තැපැල් සහ විදුලිසංදේශ අමාත්‍යවරයා වන සී. සිත්තම්පලම් මහතාගේ සහ එස්.යූ.එදිරිමානසිංහම් මහතාගේ (පදිරුප්පු) යෝජනා ස්ථිරත්වයෙන් ඇලෙක්සැන්ඩර් ෆ්‍රැන්සිස් මොලමුරේ (බලංගොඩ) මහතාගේ නමත්; විල්මට් ඒ.පෙරේරා මහතා (මතුගම) ඒ.එල්.තම්බයියා මහතා (කයිට්ස්)ගේ යෝජනා ස්ථිරත්වයෙන් හර්බට් ශ්‍රී නිශ්ශංක මහතාගේ නමත් ඒ සඳහා ඉදිරිපත් කර ඇත. ඡන්ද 58ක් මොලමුරේ මහතාටද, එච්.ශ්‍රී නිශ්ශංක මහතාට ඡන්ද 41ක්ද, වැළැකී සිටි ඡන්ද 2ක්ද තිබී ඇති හෙයින් වැඩි ඡන්ද ලබා ගත් මොලමුරේ මහතා කථානායක ධුරයට පත්ව ඇත. (1931 ජූලි 07 සිට 1934 දෙසැම්බර් 10 දින දක්වා පළමුවන රාජ්‍ය සභාවේද කථානායක ධුරය උසුලන ලද මොලමුරේ මහතා 1947 ඔක්තෝබර් 14 දින සිට 1951 ජනවාරි 25 දින දක්වා මෙම පදවිය දරා ඇත). සභාවේ වැඩ කටයුතු එදින අපරභාග 2.55ට අවසන් කොට ඇති එදින සභාවේ සියලු වැඩ කටයුතු ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් සිදුව ඇති බවද පෙනේ. ෆ්ලොරන්ස් සේනානායක මහත්මිය (කිරිඇල්ල), කුසුමසිරි ගුණවර්ධන මහත්මිය (අවිස්සාවේල්ල) සහ තමරා කුමාරි ඉලංගරත්න මහත්මිය (මහනුවර) යන මන්ත්‍රීවරියන්ගෙන් සැදුම්ලත් එම පාර්ලිමේන්තු නියෝජිත මන්ත්‍රීමණ්ඩලයේ කාන්තා නියෝජනය සියයට 2.97ක් වී ඇත.

***මූලාශ්‍රය:*** *1947 පාර්ලිමේන්තු - නියෝජිත මන්ත්‍රී මණ්ඩලයේ හැන්සාඩ් වාර්තාවේ පළමුවන වෙලුම*



**ගුණවතී පිටවල**
**සහකාර හැන්සාඩ් සංස්කාරක**

# නිලධර විත්ති

කුෂාණි රෝහණදීර මහත්මිය වත්මන් පාර්ලිමේන්තුවේ සහකාර මහලේකම් (පරිපාලන සේවා) ධුරය හොබවයි. ඇය 2012 වර්ෂයේ සිට මෙම තනතුරෙහි කටයුතු කරන අතර පාර්ලිමේන්තු සම්ප්‍රදාය, ස්ථාවර නියෝග මෙන්ම කමිටු ක්‍රමය පිළිබඳව ද  අත්දැකීම් සම්භාරයකට හිමිකම් කියන ජ්‍යෙෂ්ඨ නිලධාරිනියකි.

සම්පත් බැංකුවේ කනිෂ්ඨ විධායක නිලධාරිනියක ලෙස සිය වෘත්තීය දිවිය ආරම්භ කළ රෝහණදීර මහත්මිය පසුකාලීනව ජාතික අධ්‍යාපන ආයතනයේ දුරස්ථ අධ්‍යාපන කටයුතු පිළිබඳ අධ්‍යක්ෂවරියගේ පෞද්ගලික සහකාරවරිය ලෙසද සේවය කර තිබේ.

1999 දී පාර්ලිමේන්තු නිලධාරිනියක ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සේවයට එක් වූ ඒ මහත්මිය පාර්ලිමේන්තු මහලේකම් කාර්යාලයේ විවිධ දෙපාර්තමේන්තු සහ කාර්යංශ ගණනාවක සහකාර ප්‍රධාන නිලධාරි සහ නියෝජ්‍ය ප්‍රධාන නිලධාරි තනතුරුවල කටයුතු කර ඇත.



**කුෂාණි රෝහණදීර**
සහකාර මහලේකම්
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයේ කීර්තිමත් ආදි ශිෂ්‍යාවක වන එතුමිය  ප්‍රථමයෙන්ම කොළඹ විශ්වවිද්‍යාලයෙන් විද්‍යාවේදී  උපාධිය  හිමිකරගත්තාය. අනතුරුව, ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලයෙන් නීතිවේදී උපාධිය ලබාගත් ඇය නීති විද්‍යාලයෙන් නීතිඥ විභාගය සමත්ව ශ්‍රේෂ්ඨාධිකරණයේ නීතිඥවරියක ලෙස ප්‍රතිඥා දී ඇත.

ඉන්දියාවේ  පාර්ලිමේන්තු  අධ්‍යයන හා පුහුණු කාර්යංශයෙහි (BPST) පාර්ලිමේන්තු ක්‍රියාපටිපාටි, පරිචයන්  සහ ව්‍යවස්ථාදායක කෙටුම්පත්කරණය පිළිබඳවද පුහුණුවක්  ලබා ඇති එතුමිය කැනඩාවේ මොන්ට්‍රියල්හී මහජන පර්යේෂණ විශ්වවිද්‍යාලය ඇතුළුව රටවල් ගණනාවක ව්‍යවස්ථාදායකයන්හි පවත්වන ලද පාර්ලිමේන්තු ක්‍රියාපටිපාටි පිළිබඳ වැඩසටහන් රැසක් සඳහා ද සහභාගී වී තිබේ.

ටිකිරි කේ. ජයතිලක මහතා වත්මන් පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම්වරයා වෙයි. 2002 වර්ෂයේ දී නීතිපති දෙපාර්තමේන්තුවට සම්බන්ධ වීමෙන් සිය වෘත්තීය දිවිය ආරම්භ කළ ටිකිරි කේ. ජයතිලක මහතා රජයේ අධිනීතිඥයෙකු ලෙස මහේස්ත්‍රාත් අධිකරණ සහ මහාධිකරණ රැසක නඩු කටයුතු මෙහෙයවා ඇත. වර්ෂ 2006 දී අධිකරණ සේවයට සම්බන්ධ වූ ජයතිලක මහතා මහේස්ත්‍රාත්වරයෙකු ලෙස සේවය කරමින් ලංකාවේ විවිධ ප්‍රදේශවල උසාවි ගණනාවක සේවය කොට ඇත.

අධිකරණ  අමාත්‍යාංශයේ සහයෝගීත්වයෙන් ශ්‍රී ලංකා  විනිශ්චයකාරවරයන්ගේ ආයතනය විසින් පවත්වන ලද ළමා ආරක්ෂණ සහ බාලක යුක්තිය පිළිබඳ විශේෂ වැඩසටහනට සහභාගී වී ඇති ජයතිලක මහතා අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ළමා කටයුතු පිළිබඳ උපදෙස් ලබා ගැනීම සම්බන්ධයෙන් නම් කල අධිකරණ නිලධාරී මඬුල්ලේ සාමාජිකයෙක් ද වෙයි. බාලක යුක්තිය පිළිබඳ නවක මහේස්ත්‍රාත්වරුන් පුහුණු කිරීමේ කටයුතු සඳහා ද ඒ මහතා සිය දායකත්වය සපයා ඇත. 2015 වර්ෂයේ දී සහකාර මහ ලේකම්වරයෙකු ලෙස ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ  සේවයට එක්වන ජයතිලක මහතා වර්තමානයේ ව්‍යවස්ථාදායක සේවා පිළිබඳ සහකාර මහ ලේකම්වරයා ලෙස කටයුතු කරයි.



**ටිකිරි කේ. ජයතිලක**
සහකාර මහලේකම්
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

ටිකිරි කේ. ජයතිලක මහතා කොළඹ විශ්වවිද්‍යාලයේ නීති පීඨයෙන් නීතිවේදී උපාධිය ද, එංගලන්තයේ නෝතම්බ්‍රියා විශ්වවිද්‍යාලයෙන් නීතිපති උපාධිය ද හදාරා ඇති අතර, කොළඹ විශ්වවිද්‍යාලයේ  වෛද්‍ය පීඨයේ අපරාධ වෛද්‍ය විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාධාරියෙකු ද වෙයි. ඒ මහතා මේ වන විට ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මානව ශාස්ත්‍ර හා සමාජීය විද්‍යා පීඨයේ අපරාධ විද්‍යාව සහ අපරාධ යුක්තිය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය හදාරමින් සිටී. ඒ මහතා ප්‍රජා පාදක විශෝධනය පිළිබඳ ග්‍රන්ථයක්ද පළ කොට තිබේ.

# ඡායා ගැලරිය

## දැනුමෙන් සන්නද්ධව පාර්ලිමේන්තුවට





## විරුවන් සමරමින් පොපිමල් පැළඳීමට එක්වන කථානායකතුමන් සහ මහලේකම්තුමන්





## නවවැනි පාර්ලිමේන්තුවට සෙත් පතා බෝධි පූජාමය පින්කමක්






සන්නිවේදන දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව,
ශ්‍රී ජයවර්ධනපුර,
කෝට්ටේ.

දුරකථනය : +94 11 2777100
ෆැක්ස් : +94 11 2777227

Parliament of Sri Lanka @ParliamentLK @slparliament Parliament of Sri Lanka